**අක්කරෙයිපත්තු ප්‍රාදේශීය සභාව - 2022**

-----------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

අක්කරෙයිපත්තු ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උප වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට අක්කරෙයිපත්තු ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම්, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍යයන් සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත්වේ.

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී මිලදී ගත් රු.969,500 ක කසළ ඇඹරීමේ යන්ත්‍රයේ වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | ඉදිරි අවසන් ගිණුම් වාර්තාවේ දැක්වීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව සකස් කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් ලබා දුන් රු.284,659 ක් වූ රූපවාහිනියේ වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | -එම- | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් සභාවට භාරදුන් වර්ග 06 ක ලී බඩු උපකරණ සහ ලෙනෝවෝ ටේප් රෙකෝඩරයේ වටිනාකම ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | -එම- | -එම- |
| (ඈ) | සූර්ය කෝෂ පහන් මිලදී ගැනීම සහ සවිකිරීමට වැය වූ එකතුව රු.2,233,500 මූල්‍ය ප්‍රකාශනවල රු.2,162,348 ක් ලෙස අඩුවෙන් දක්වා තිබුණි. | මෙය නිවැරදි කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ බව. | -එම- |
| (ඉ) | මුදලින් අත්තිකාරම් ලැබීම් හා ගෙවීම් පිළිවෙලින් රු.5,200,035 ක් සහ රු.7,778,882 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ දෝෂයකින් පිළිවෙලින් රු.12,686,361 ක් සහ රු.12,998,872 ක් ලෙස දක්වා තිබුණි. | අත්තිකාරම් ලැබීම් හා ගෙවීම් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | -එම- |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු.1,516,767 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.249,928 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභාව විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| i. | වරිපනම් හා බදු | 50,000 | 150,000 | 150,000 | - | 25,000 | - | - | - |
| ii. | කුලී | 3,850,000 | 3,522,969 | 3,661,974 | - | 3,110,000 | 3,613,270 | 3,561,674 | 139,005 |
| iii. | බලපත්‍ර ගාස්තු | 600,000 | 469,450 | 469,450 | - | 518,000 | 573,150 | 573,150 | - |
| iv. | වෙනත් ආදායම් | 4,395,000 | 494,657 | 494,657 | - | 4,262,500 | 825,282 | 1,069,825 | - |
| | එකතුව | 8,895,000 | 4,637,076 | 4,776,081 | - | 7,915,500 | 5,011,702 | 5,204,649 | 139,005 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ සියළුම ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය පිළිබඳ නිරීක්ෂණයන් පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **උසාවි දඩ ගාස්තු සහ මුද්දර ගාස්තු** | | |
| (i) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2022 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ ගාස්තු රු.1,916,700 ක් සහ මුද්දර ගාස්තු රු.1,743,563 ක් විය. | උසාවි දඩ ගාස්තු සහ මුද්දර ගාස්තු අයකිරීමට පියවර ගන්නා බව. | ආදායම් කඩිනමින් අයකිරීමට පියවර ගත යුතුය. |
| (ii) | ජංගම සේවාවන් මගින් නැගෙනහිර පළාත් ආදායම් බදු දෙපාර්තමේන්තුව විසින් ඉඩම් හිමියන් 10 කගෙන් වැඩිපුර අයකර ගත් රු.635,800 ක් වටිනා මුද්දර ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ලිපි ලේඛන යවා ඇති නමුත් මේ සඳහා වූ මුදල් ලැබී නොමැති බව. | -එම- |

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ භාවිතයේ පවතින ට්‍රැක්ටර් 07ක් කුලියට දීමෙන් ආදායම් ඉපැයීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරි කාලයේදි කුලියට දීමට කටයුතු කරන බව. | ට්‍රැක්ටර් කුලියට දීමෙන් ආදායම් ඉපැයීමට කටයුතු කළ යුතුය. |

### 3.2 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව සතු වාහන 02 ක් දෝෂයට ලක්වී තිබූ නමුත් ඒවා අළුත්වැඩියා කර නැවත භාවිතා කිරීමට හෝ සුදුසු පරිදි අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරි කාලයේදි සියළුම අළුත්වැඩියා කටයුතු ඉටුකිරීමට කටයුතු කරන බව. | වාහන අලුත්වැඩියා කර නැවත භාවිතා කිරීමට හෝ සුදුසු පරිදි අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.3 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සංවර්ධන ප්‍රදාන වැඩසටහන යටතේ විවිධ සේවා ගොඩනැගිල්ල වැඩිදියුණු කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදි රු.7,832,250කට සභාව විසින් කොන්ත්‍රාත්වලට එළැඹ තිබුණි. කොන්ත්‍රාත් කාර්යයන් 2022 ජූනි 10 දින අවසන් කළයුතුව තිබූ නමුත් සභාවේ සුවිශේෂී අධීක්ෂණයක් නොමැතිවීම හා අකාර්යක්ෂම මෙහෙයවීම් හේතුවෙන් අදාල කාර්යය මාස 06ක් ඉක්මවීමෙන් පසුව අවසන් කිරීමට සිදුවීමෙන් රටෙහි පැවැති උද්දමනකාරී තත්ත්වයට භාජනය වීමෙන් සියයට 20ක මිලගණන් වැඩිවීමකට හෙවත් රු. 808,801ක වැඩිපුර මුදලක් කොන්ත්‍රාත්කරුට ගෙවීමට සිදුවී තිබුණි. තවද, මෙම ගොඩනැගිල්ල භාවිතා කිරීමට විගණන දිනය වන විටත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | රටෙහි පැවැති අයහපත් වාතාවරණය හේතුවෙන් භාණ්ඩ මිලගණන් වැඩිවීමට අනුකූලව කොන්ත්‍රාත්කරුට වැඩිපුර ගෙවීමට සිදු වූ බව. | කොන්ත්‍රාත් ප්‍රකාරව, අදාල කාර්යය නියමිත දිනය තුළ අවසන් කිරීමට කටයුතු කළ යුතුය. |